# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2384/29 - 2024 මැයි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2024.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක ජී. ඒ. 2232 දරන හා පල්ලෙකැලේ කුණ්ඩසාලේ යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන, ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි (SIBA) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව එකී පනත යටතේ සාදන ලද සහ 2016 අගෝස්තු 09 වැනි දින අංක 1979/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය යටතේ වන අන්තර්ගතය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අන්තර්ගතය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන *උපලේඛනය***

***කොන්දේසි***

01. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි (SIBA) ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවම අධ්‍යයන සම්භාර 90 ක් සහිත (එස්. එල්. කිව්. එෆ් 5 වන ස්ථරයේ) තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණවේදී පාඨමාලාව හැදෑරීම සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීමේ දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

02. එසේ වුවද, ඉහත සඳහන් කරන ලද ඇතුළත් කර ගැනීමේ අවම සුදුසුකම්වලට අමතරව, යම් ශිෂ්‍යයෙකු පහත දැක්වෙන අකාරයේ -

    (අ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය (SLIATE) විසින් ප්‍රදානය කරනු ලබන උසස් ජාතික තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාව සහ

(ආ) අදාළ උපාධි පාඨමාලාවේ හතරවන අධ්‍යයන වාරයට පෙර අනුමත අධ්‍යයන සම්භාර ලබා ගැනීම සඳහා වන යම් හිදසක් පිරවීමට අවශ්‍ය වන නිශ්චිත බලධරයා විසින් නිශ්චිතව දක්වා ඇති සියලු මොඩියුල

සාර්ථකව සම්පූර්ණ කර ඇත්තේ නම්, එම ශිෂ්‍යයා තොරතුරු තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා හතරවන අධ්‍යයන වාරයට ඇතුළත් කරගනු ලැබිය හැකිය.

03. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි (SIBA) ආයතනය පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වැනි තීරය*<br>*උපාධිය* | *II වැනි තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධි | බී ටෙක් (තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන) |

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2024 මැයි මස 14 වැනි දින,
කොළඹ දී ය.

EOG 05 - 0124

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.